පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
**Police Media Division**

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No — 1044 / 2022

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2022.07.18 පැය 1935

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තර්ජනය කරමින් සමාජ මාධ්‍ය ජාලා වල පළ කෙරෙන දැන්වීම් පිළිබඳ ගරු කථානායක තුමා විසින්ද පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.**

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තර්ජනය කරමින් සමාජ මාධ්‍ය ජාලා වල පළ වන දැන්වීම් පිළිබඳව විමර්ශනයක් පවත්වන ලෙසට ඉල්ලමින් ගරු කථානායක තුමා විසින්ද පොලිස්පති වෙත ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව 1981 අංක 02 දරණ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව 2022.07.19 වන දින අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු තොරා පත් කර ගැනීම සඳහා නාම යෝජනා ලබා ගැනීමටත්, 2022.07.20 වන දින ඒ සඳහා ඡන්ද විමසීම පැවැත්වීමටත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් කටයුතු සංවිධානය කර ඇති බව එමගින් දන්වා ඇත. එම පනතේ 20 වන වගන්තිය හා පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) විධිවිධාන අනුව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකුට කුමන ආකාරයකින් හෝ අයුතු බලපෑම් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවද, යොමු කර තිබෙන පැමිණිලි ලිපියේ සඳහන් කොට තිබේ.

එම පැමිණිලි ලිපිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත යොමු කර තිබෙන අතර, අදාල විමර්ශනය සම්බන්ධව පරිඝණක අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් අලුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත බී වාර්තාවක් මගින් අද දින කරුණු වාර්තා කිරීමට කටයුතු කර ඇති අතර, කඩිනමින් විමර්ශන කටයුතු සිදු කරයි. මෙවැනි දැන්වීම් සකසන්නන්, පලකරන්නන්, හුවමාරු කරන්නන් සහ එවැනි සමාජ මාධ්‍ය ජාලා ගිණුම් පරිපාලකවරුන් සියළු දෙනා සම්බන්ධව විමර්ශනවලදී සොයා බැලෙන අතර, ඔවුන් සියළු දෙනාට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**